**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 258 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,147.98 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,144.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.22 ක් හෙවත් සියයට 0.28 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,066.98 | 1,066.79 | 0.19 | 0.02 |
| මූලධන | 81.00 | 77.97 | 3.03 | 3.74 |
| **එකතුව** | **1,147.98** | **1,144.76** | **3.22** | **0.28** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 29ක් හා දෙපාර්තමේන්තු 17ක් විසින් එකතුව රු.මිලියන 4,925.43 ක ප්‍රතිපාදන එවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.මිලියන 4,271.17ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 654.26 ක් හෙවත් සියයට 13.28 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 74.55 | 59.91 | 54.55 | 66.85 | 240.00 | 196.68 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පතු ගිණුම් 6 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 986.79 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **දිනට 31 දෙසැම්බර් 2015 ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0044/000 | 0.24 |
| 6000/0000/00/0002/0059/000 | 0.88 |
| 6000/0000/00/0013/0025/000 | 47.36 |
| 6000/0000/00/0016/0006/000 | 795.74 |
| 6000/0000/00/0017/0001/000 | 131.44 |
| 6000/0000/00/0018/0007/000 | 3.60 |
| 6003/0000/00/0034/0000/000 | 7.53 |
| **එකතුව** | **986.79** |

**2.4** **අග්‍රිම ගිණුම**

------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අංක 7002/0000/00/0305/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 411.93 ක් විය.

**2.5** **විගණන නිරීක්ෂණය**

---------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඉඩම් බදු දීමට අදාළ විධිමත් ලේඛන හා බලපත්‍ර ගාස්තු හා ඒ මත දඩ අයවීම සඳහන් කිරීමට විධිමත් ලේඛන | 2012 ජුනි 06 දිනැති අංක: 2012/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

**3.2** **විසර්ජන ගිණුම**

----------------

**3.2.1** **අයවැය විචලනය**

-----------------

වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු.300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

### 3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දි තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ රු.1,000,000 ක ඇස්තමේන්තුවක් මත හියදල ප්‍රජා ශාලාව ඉදි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සවි කර තිබුණු දොරවල් දෙක සඳහා නිසි ප්‍රමිතියෙන් යුක්ත දැව භාවිතා නොකිරීම නිසා දොරවල් දෙකෙහිම පිපිරීම් පැවැතුණි.

(ii) දොරවල්වල දැව සංකෝචනය වීම හේතුවෙන් යතුරු තහඩු ක්‍රියාත්මක නොවීම නිසා ඉබි යතුරු දෙකක් සවිකර තිබුණි.

(iii) මෙම ශාලාවේ අඩි 37ක් දිග යට ලියෙහි ස්ථාන තුනක පිපිරීම් පැවැතුණි. වහලයට යොදා තිබුණු අඩි 2 x 2 දැව අඩි 222ක් නියමිත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයෙන් ( 2 x1 ½ ) යුක්ත විය. මේ සඳහා රු.18,334 ක් වැය කර තිබුණි.

(iv) ජනෙල් / උළුවහු තුනක පිපිරීම් පැවැතුණි.

(ආ) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය යටතේ 2015 වර්ෂයට අවිච්ඡේද වු රු.400,000 කට ඇස්තමේන්තුගත පුටුහපුව හංසගිරි බේකරිය අසලින් යන මාර්ගය සංවර්ධනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ගය තද බෑවුම් සහිත නිසා තම නිවසට හානි සිදුවිය හැකි බව පවසා ගම්වැසියෙකු විරුද්ධත්වය ප්‍රකාශ කිරීම හේතුවෙන් මාර්ගයේ සංවර්ධන කටයුතු නතර කර තිබුණි.

(ii) මාර්ගයේ පහළින් යොදා තිබුණු බෝක්කු මාර්ගයට අවශ්‍ය පරිදි යොදා නොතිබුණි.

(iii) නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම නිසා සමාජ ප්‍රතිලාභ ලැබීමේ ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ඇ) එක් ගමකට එක් වැඩක් යටතේ රු.500,000කින් ක්‍රියාත්මක වු මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගල්කොටුව බහුකාර්ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම 2015 නොවැම්බර් 19 දින වනවිට වැඩ නතර කර තිබීම නිසා බිත්ති කපරාරු කිරීම ජනෙල් දොරවල් සවි කිරීම ආදී කටයුතු නිම කර නොතිබුණි. මේ නිසා මෙම ව්‍යාපෘතියෙන් සමාජ සංවර්ධනයට ලැබීමට තිබූ දායකත්වය ලැබී නොතිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවස්ථා 8 කදී විවිධ වැඩසටහන ක්‍රියාත්මක කිරිමට ලබා දී තිබුණු අත්තිකාරම් කාර්ය ආරම්භ කිරීමට දින 4 ක සිට දින 7 ක් දක්වා කාල

පරාසයකට පෙර අත්තිකාරම් නිකුත් කිරීම නිසා ලබාගෙන තිබුණු අත්තිකාරම් එම නිලධාරීන් විසින් එකී කාල පරාසය තුළ අත රඳවාගෙන තිබුණි.

(ආ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත්, උඩපළාත, කුණ්ඩසාලේ, උඩදුම්බර, පාතදුම්බර, මැදදුම්බර හා දොළුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 52කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.421,140 ක තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම කර දින 10 ක සිට මාස 2½ ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර පියවා තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.285,300,654 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 10 ඉක්මවූ එකතුව රු.983,373ක් වූ ඉඩම් ඉල්ලීම් තැන්පතු 07ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබුණු මුදලින් අවස්ථා 16 කදී එකතුව රු.358,482 ක මුදලක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම තැන්පත්වල කාලය ඉකුත් වී තිබුණත්, එම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,223,088 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 6 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. එම ශේෂයෙන් රු.3,521,038 ක් 2016 ජුලි 30 දින වනවිට අයවී ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා තිබුණි.

## 3.6 බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ යකට අඩු කාලයක සිට පැවැත එන එකතුව රු.1,459,655 ක බැරකම් විය.

## 3.7 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඇති රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා රජයේ ඉඩම් කාර්යය සංග්‍රහයේ 180 වැනි නියෝගයේ දක්වා ඇති උපදෙස් මත ක්‍රියා නොකිරීම හේතුවෙන් ග්‍රාම සේවා වසම් 03 ක පදිංචිකරුවන් 17 දෙනෙකු අනවසරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

**3.8 දේශීය මුල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් එකතුව රු.මිලියන 21.53 ක ඇස්තමේන්තුගත/ අනුමත කළ වටිනාකම් වූ ව්‍යාපෘති 30 ක ව්‍යාපෘති ආරම්නොකර අතහැර තිබුණි.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත/ අනුමත වටිනාකම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | | | රු.මිලියන | |
| (i) | යටිනුවර | 05 | 2.23 | නිවසකට සිදුවන අලාභානියක්, ඉඩම් ආරවුල්, ප්‍රමාණවත් ජල පීඩනයක් නොතිබීම හා තාක්ෂණ නිලධාරියෙකු ස්ථාන මාරුවීම |
| (ii) | දෙල්තොට | 03 | 1.76 | දිවි නැගුම සංවර්ධන ආයෝජන වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයට වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් මිලියන ශය ක් ආපසු අමාත්‍යාං60 විසින්පවරා ගැනීම |
| (iii) | පස්බාගේ කෝරළේ | 01 | 5.59 | යොදා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳව කොන්ත්‍රාත්කරු, පළාත් පාලන ඉංජිනේරු හා උපදේශක අතර ගැටළුවක් පැන නැගීම |
| (iv) | පහතහේවාහැට | 02 | 1.00 | කාලය ප්‍රමාණවත් නොවීම |
| (v) | උඩුනුවර | 03 | 2.36 | භූමිය ලබා ගැනීමට අනුමැතිය නොලැබීම, පොදු අයිතිය ඇති ඉඩමක් ලෙස පැවරීමේ කටය ප්‍රමාදවීම හා කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් නොවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (vi) | මැදදුම්බර | 06 | 3.15 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබීම, කාලය ප්‍රමාණවත් නොවීම, අයහපත් කාලගුණය නිසා හා 2015 නොවැම්බර් 19 දින වන විට වැඩ ආරම්භ නොකිරීම නිසා අවලංගු කිරීම |
| (vii) | පූජාපිටිය | 02 | 1.23 | වැසි සහිත කාලගුණයක් පැවැතීම හා ප්‍රමාණවත් කාලයක් නොතිබීම |
| (viii) | ගඟඉහළ කොරළේ | 03 | 1.70 | අයහපත් කලගුණය, පෞද්ගලික අයිතිය සතු වතු යායක් පැවැතීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |
| (ix) | ගඟවට කොරළේ | 05 | 2.51 | නිවාස සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය නොලැබීම, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි බව නගර සභාව දැන්වීම, අයහපත් කාලගුණය හා ප්‍රාදේශීය සභාවක් විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කළ නොහැකි බව දැන්වීම |
| | | ----- | -------- | |
| | **එකතුව** | **30** | **21.53** | |
| | | == | ==== | |

**(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

---------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඇස්තමේන්තු ගත වටිනාකම රු.මිලියන 26.74 ක් වූ ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර ඉන් ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.මිලියන 1.13 ක් වැය කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු ගත වටිනාකම | 2015.12.31 දිනට වියදම | අත්හැර දැමීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | |
| (i) | කුණ්ඩසාලේ | 01 | 490,000 | 250,000 | අධික වර්ෂාව |
| (ii) | පස්බාගේ කෝරළේ | 01 | 4,219,000 | - | අමුද්‍රව්‍ය පිළිබඳ ගැටළු මතුවීම |
| (iii) | මැදදුම්බර | 02 | 784,000 | - | ඉදිකිරීම් සම්බන්ධව වාරණ නියෝගයක් ලැබීම |
| (iv) | පූජාපිටිය | 03 | 1,960,000 | 714,280 | වැසි සහිත කාල ගුණයක් පැවැතීම |
| (v) | ගඟඉහළ කෝරළේ | 03 | 10,350,000 | - | 2014 වර්ෂයේදී අවිච්ඡේද වූ ව්‍යාපෘතියක් වීම, අවසාන අධියර ක්‍රියාත්මක නොකිරීම හා කළ ඉඩම රජයට අයත් නොවීම නිසා එය පවරා ගන්නා තෙක් ව්‍යාපෘතිය සඳහා ගෙවීම් නොකිරීම. |
| (vi) | උඩදුම්බර | 01 | 7,071,416 | 170,507 | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය නිම නොකිරීම |
| (vii) | උඩුනුවර | 04 | 1,862,000 | - | ව්‍යාපෘතියක් වෙනුවෙන් විරෝධතා ඇතිවීම, ඉතිරි වැඩ නිම කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ප්‍රාදේශීය සභා අරමුදල්වලින් එක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබීම, ඇස්තමේන්තුව ප්‍රකාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම |
| | **එකතුව** | **15** | **26,736,416** | **1,134,787** | |

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 03 ක් විසින් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 48.59 ක් වටිනා ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කර ඉන් ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් රු. මිලියන 19.58 ක් වැය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු ගත වටිනාකම | 2015.12.31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | රු.මිලියන | |
| (i) | හාරිස්පත්තුව | 01 | 30.45 | 11.85 | අධික වර්ෂාවක් පැවැතීම |
| (ii) | අකුරණ | 05 | 3.24 | - | ව්‍යාපෘති 4 ක් සඳහා අදාළ සැපයුම්කරුවන් විසින් ඇණවුම් කළ භාණ්ඩ සැපයීමට නොහැකිවීම. එක් ව්‍යාපෘතියට අදාළ ප්‍රතිලාභියා වන පල්ලියේ සහයෝගය නොලැබීම. |
| (iii) | පාතහේවාහැට | 07 | 14.90 | 7.73 | අධික වර්ෂාව |
| | **එකතුව** | **13** | **48.59** | **19.58** | |

**3.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ රු.383,722 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.10 අක්‍රමික ස්වරූපයේ ගනුදෙනු**

මහනුවර දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන් 25 දෙනෙකු මහජන නියෝජිතයින් ලෙසද පෙනී සිට යතුරුපැදි දෙක බැගින් ලබාගෙන තිබුණි. ඒ අනුව එකක් රු.194,920 බැගින් යතුරුපැදි 25ක් සඳහා වන රු.4,873,000ක අමතර වැයක් රජය විසින් සිදු කර තිබුණි.

**3.11 පාඩු හා හානි**

යතුරුපැදි හිමිකම් ලැබූ නිලධාරීන් එසේ හිමිකම් නොලබන වෙනත් රැකියාවක් සඳහා සේවයෙන් ඉවත්වයාමේදී යතුරුපැදියේ මුළු වටිනාකම ආපසු ගෙවිය යුතු වුවත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ නිලධාරීන් 04 දෙනෙකු මධ්‍යම පළාතේ ගුරු පත්වීම් ලබා ගොස් තිබුණු අතර, යතුරුපැදිවල මුළු වටිනාකම ආපසු ගෙවා නොතිබුණි. මේ හේතුව මත ස්කූටර් 04ක් සඳහා වූ රු.846,807ක මුදලක් අයකර නොතිබුණි.

**3.12** අනාර්ථික ගනුදෙනු

---------------------

පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ විමධ්‍යගත අරමුදල් යටතේ ආරම්භ කර තිබුණු 2015 වර්ෂයට අවිච්ඡේද වූ නිකතැන්න ජල ටැංකිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් ජල ටැංකියේ තිබූ ජල කාන්දුව වළක්වා ගැනීම සඳහා රු.50,000 ක් වැය කර තිබුණි. 2016 පෙබරවාරි 14 දින සිදු කළ ස්ථානීය පරික්ෂාව අනුව ජල ටැංකිය සංවර්ධනය කළ පසුවද ජල කාන්දුව තව දුරටත් පැවති බව නිරීක්ෂණය විය.

**3.13** විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවට යොමුව** | | **යොමුගත විෂය** |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2010 | 4.10(i) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයට අයත් වාහනයක් 2009 ජනවාරි 26 දින අනතුරකට ලක්වීමෙන් පසුව රු.246,260ක අලාභහානියක් සිදු වී තිබුණි. එම අනතුර සිදුවී මාස තුනක් ඇතුළත මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර කළයුතු වුවත්, අනතුර සිදුවී වර්ෂ 2ක් ගතවී තිබුණත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| 2010 | 4.10 (v) | 2008 වර්ෂයේ වාහන අනතුරකින් සිදුවූ රු.360,435ක අලාභ හානිය සම්බන්ධයෙන් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් වගකිව යුතු බවට තීරණය වී තිබුණත්, එම අලාභය අයකර ගෙන නොතිබුණි. |

**3.14** කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය පාලනයේ දී මහජනයා සමඟ සමීපව කටයුතු කිරීම මෙන්ම ඔවුන්ගේ ගැටළුවලට විසඳුම් ලබාදීමේ දී ප්‍රාදේශිය ලේකම්වරයා නිල නිවසේ පදිංචිවීම වැදගත් වුවද, තුම්පනේ සහ පන්විල ප්‍රාදේශිය ලේකම්වරුන් එම නිවාසවල පදිංචි වී නොතිබුණි. නිල නිවාසවල පදිංචි නොවීම හේතුවෙන් මෙම නිවාස ඉදිකිරීමට වැය කළ මුදල නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) තුම්පනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අංක CPPD – 4379 දරන නිල රථය 2015 දෙසැම්බර් 14 දින ගාල් කර තිබියදී වාහනය පහළට පැමිණ අනතුරක් සිදු වී තිබුණු අතර, රියදුරුගේ නොසැලකිලිමත් භාවය හා නිසි ආරක්ෂණ ක්‍රම අනුගමනය නොකිරීම නිසා මෙම අනතුර සිදු වී ඇති බව වාර්තා වී තිබුණි. මේ සඳහා රථයට වූ අලාභය රු.374,367ක් වශයෙන් ගණනය කර තිබුණු අතර, 2016 මාර්තු 08 දින වන විටත් අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයට අයත් ප්‍රොස්පෙක්ට්හිල් නැමැති ඉඩමේ පිළිවෙලින් පර්චස් 7.14 හා 13.38ක් වශයෙන් මුළු පර්චස් 20.52 ක පුද්ගලයින් දෙදෙනෙකු විසින් අනවසරයෙන් පදිංචි වී සිටින අතර, එහි සන්තකය ආපසු ගැනීමට කාර්යාලය අපොහොසෙත් වී තිබුණි.

(ඇ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නාය යෑමෙන් අවතැන් වූ පවුල් සඳහා බෙදා දීමට තෝරාගත් ප්‍රොස්පෙක්ට්හිල් නැමැති ඉඩම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අයිතිවාසිකම් කීම නිසා නායයාමෙන් අසරණ වූ පවුල් සඳහා ඉඩම් ලබා දීමට නොහැකි වි තිබුණි.

(ඉ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මහනුවර වටපුළුව, ග්‍රාම නිලධාරී වසමට අයත් පී.පී.ඒ. 1454 දරන පිඹුරට අදාළ කැබලි අංක 03, සුභසාධක සංගමයක සාමාජිකයින් 13 දෙනෙකු සඳහා ලබා දීමට අදාළ බදු අනුමැතිය 2014 අගොස්තු 05 දිනැති අංක 4/10/23359 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ හා ලිපිය මඟින් අවලංගු කර තිබුණි. කාර්යාලය විසින් එම ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීමට 2016 මාර්තු 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

මේ නිසා ඉඩම් කට්ටි ලබා ගැනීමට කටයුතු කළ පුද්ගලයින් ඉඩම් බදු දීම අවලංගු කිරීමට විරුද්ධව අභියාචනා අධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර, එම නඩුවේදී "ඉඩම් බදු දීමේ අනුමැතිය අවලංගු" කිරීමට හේතු වූ කාරණා සැලකිල්ලට නොගෙන ඉඩම් කොටස් පෙත්සම්කරුවන්ට නැවත ලබා දීමට යෝජනා කරමින් සමථයක් ඇතිකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ඊ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විගණනය සඳහා ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව 2015 වර්ෂයේ හිඟ වාර්ෂික ඉඩම් බලපත්‍ර ගාස්තුව රු.265,199ක් ලෙස දක්වා තිබූ නමුත්, විගණනයේ දී සිදුකළ ගණනය කිරීම් අනුව වසම් 12 ක බදුකරුවන් 43 දෙනෙකුගෙන් රු.946,501ක් අයවිය යුතුව තිබුණි.

(උ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලීන බදු බලපත්‍රවලට අදාළ තෝරාගත් ලිපිගොනු කිහිපයක් පිළිබඳව කරන ලද පරීක්ෂාවේ දී, ලිපිගොනු (බලපත්‍ර) 02කට අදාළව වාරික මත රු.69,485ක හිඟයක් හා නියමිත කාලය තුළ මුදල් අය නොවීම මත රු.200,000ක පොලියක් වශයෙන් එකතුව රු.269,485ක මුදලක් රජයට අයවිය යුතුව තිබූ නමුත් එම මුදල් අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ඌ) කුණ්ඩසාලේ උතුර ග්‍රාම නිලධාරී වසමේ පල්ලෙකැලේ ග්‍රාමයේ පර්චස් 20 ක් වූ මු.පි.මහ 5253 කැබලි අංක 33 දරන ඉඩම් කොටස ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ නිලධාරීන් වෙත බෙදා දී තිබූ අතර බදු කුලිය නොකඩවා ගෙවිය යුතු විය. බදු පැහැර හරින අවස්ථාවන්හිද ගිවිසුම ඉබේම අහෝසි විය යුතු වුවත්, ඉඩම් කොටසක් ලබා ගත් නිලධාරිනියකගෙන් 2015 දෙසැම්බර් 02 වන විට වසර 7ක බදු කුලිය වූ රු.68,160ක් අය කර නොතිබුණි. 2004 ජුලි 04 දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ (එ) වගන්තිය අනුව බදු ගිවිසුම අහෝසි කර ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදු පදනම මත ඉඩම් ලබාදුන් බදුකරුවන් 5 දෙනෙකුගෙන් රු.77,456ක හිඟ බදු ආදායමක් අයවී නොතිබුණි. ඒ පිළිබඳව වාර්තා හෝ පොත්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නොතිබුණි. එසේම එම හිඟ හිටි බදු ආදායම අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඒ) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නියමිත දිනට බදු මුදල් නොගෙවූ බදුකරුවන් 03 දෙනෙකුගෙන් සියයට 10ක් වූ රු.49,850ක දඩ පොලිය අයකර ගෙන නොතිබුණි.

(ඕ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව මඟින් නිකුත් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ 11.4 (v) ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික සඳහා දේපළවල වටිනාකමෙන් සියයට 1.15ක බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතු වුවද, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2014, 2015 වර්ෂයන්හි දී හා 2016 මාර්තු මාසය දක්වා දේපළ වටිනාකමින් 1%ක් අයකිරීම හේතුවෙන් රු.39,558ක ආදායමක් රජයට අහිමි වී තිබුණි.

## 3.15 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 70 | 65 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 51 | 31 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 2,055 | 1,866 | 189 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 243 | 208 | 35 |
| | **එකතුව** | **2,419** | **2,170** | **249** |